# INSURANCE
# (Part-I)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# රක්ෂණය

රක්ෂිතයා විසින් වාරික ගෙවීමටත්, රක්ෂිත උපද්‍රව හේතුවෙන් රක්ෂිතයාට සිදු විය හැකි අලාභ සඳහා රක්ෂකයා විසින් වන්දි ගෙවීමටත්, රක්ෂිතයෙකු හා රක්ෂකයෙකු අතර ඇති කර ගන්නා එකඟතාව රක්ෂණය ලෙස හැඳින්විය හැකි ය.

## අවදානම

රක්ෂණයේ දී මූල්‍යමය වශයෙන් ඇස්තමේන්තු කළ හැකි හානියක් සිදු වීමට  ඇති ඉඩකඩ අවදානමක් ලෙස අර්ථ දැක්විය හැකි ය.

## ව්‍යාපාර කටයුතු කර ගෙන යාමේ දී සිදු විය හැකි විවිධාකාර අවදානම්

**නිදසුන් :**

- ව්‍යාපාරය ගිනි ගැනීම
- සොරසතුරු උවදුරු
- ව්‍යාපාරය පාඩු ලැබීම
- ව්‍යාපාරයේ දේපළවලට සිදු විය හැකි හානි

ClassWork.LK

# රක්ෂණය වර්ග කිරීම

අවදානම්, රක්ෂණය කළ හැකි අවදානම් හා රක්ෂණය කළ නො හැකි අවදානම් ලෙස වර්ග කළ හැකි ය.

# රක්ෂණය කළ හැකි අවදානම්

## රක්ෂණය කළ හැකි අවදානම් සඳහා උදාහරණ

- ගොඩනැගිලි ගිනි ගැනීම මගින් සිදු වන අවදානම්
- රථවාහන අනතුරු අවදානම්
- මාර්ගස්ථ මුදල්වලට සිදු වන හානි
- ණයගැතියකුගෙන් ලැබිය යුතු මුදල් නො ලැබීමේ අවදානම

ClassWork.LK

# රක්ෂණය කළ හැකි අවදානම්වල තිබිය යුතු ලක්ෂණ

- අවදානම පුරෝකථනය කළ හැකි වීම

- අනාගතයේ සිදු විය හැකි අවදානම මූල්‍යමය වශයෙන් තක්සේරු කළ හැකි වීම

- අවදානම නියත නො විය යුතු වීම. එනම් අලාභය සිදු විය යුත්තේ අහඹු ලෙස වීම

- සම්බන්ධතාවලින් තොර වීම. එනම් සිදු වූ පාඩුව වෙනත් රක්ෂිත අලාභ හා සම්බන්ධ නො විය යුතු ය.

- සත්‍යාපනය කළ හැකි වීම. එනම් අලාභය සිදු වීමේ හේතුව, ස්ථානය, වේලාව හා ප්‍රමාණය විශ්ලේෂණය කළ හැකි විය යුතු ය.

ClassWork.LK

# රක්ෂණය කළ නොහැකි අවදානම්

රක්ෂණය කළ හැකි අවදානමක් වීම සඳහා රක්ෂණය කළ හැකි අවදානම්වල තිබිය යුතු ලක්ෂණ ඉටු වීම අවශ්‍ය වේ.

එම කරුණු ඉටු නො වන්නේ නම් ඒවැනි අවදානම් රක්ෂණය කළ නො හැකි අවදානම් වේ.

## රක්ෂණය කළ නො හැකි අවදානම් සඳහා උදාහරණ

- ව්‍යාපාරය පාඩු ලැබීම

- ස්වභාවික හේතූන් නිසා ඇති වන අවදානම් (ක්ෂයවීම්, යල්පැනීම්, වාෂ්පවීම්)

- තම හැකියා හා ශක්තිය මත තීරණය වන අවදානම් (විභාග අසමත් වීම, ආදරය අහිමි වීම)

- මෝස්තර වෙනස්වීම් නිසා සිදු වන අවදානම්

ClassWork.LK

# වපාපාරවල පැවැත්ම සඳහා රක්ෂණය වැදගත් වන ආකාරය

- රක්ෂණය මගින් ව්‍යාපාර අවදානම් ආවරණය කරන නිසා ව්‍යාපාර ආරම්භ කිරීමට ආයෝජකයින් පෙළඹීම

- ආබාධිත තත්ත්වයක දී හෝ මරණයක දී මූල්‍යමය ආරක්ෂාව ලැබීම (සේවකයන්ට)

- රක්ෂණ සමාගම් තමන් සතු අරමුදල් නැවත ආයෝජනය කිරීමෙන් රටේ ආර්ථික සංවර්ධනයට අවශ්‍ය ප්‍රාග්ධනය සැපයීම

- මුහුදු උවදුරු රක්ෂණය නිසා ජාත්‍යන්තර වෙළෙඳම දියුණු වීමයි

ClassWork.LK

## රක්ෂණ ගිවිසුම

රක්ෂණ ගිවිසුමක් යනු රක්ෂණ ආවරණයක් ලබා ගැනීමට අපේක්ෂා කරන පුද්ගලයා ඉදිරිපත් කරන රක්ෂණ යෝජනා පත්‍රයක්, රක්ෂණ ආයතනය විසින් පිළිගැනීමෙන් පසු එම දෙපාර්ශ්වය අතර ඇති කර ගන්නා ලිඛිත එකඟතාවයි.

## රක්ෂණ ඔප්පුව

රක්ෂණ ඔප්පුව යනු කසියම් ජීවිතයකට හෝ දේපළයකට අදාළ ව රක්ෂණ ගිවිසුමක් ඇති වූ පසු ව ඊට අදාළ ව රක්ෂණ සමාගම විසින් රක්ෂිතයාට දෙනු ලබන ලිඛිත සහතකි යයි.

Class Work.LK

# රක්ෂණ ගිවිසුමකට සම්බන්ධ පාර්ශ්ව

## පළමු පක්ෂය (රක්ෂිතයා)

රක්ෂණ යෝජනාව ඉදිරිපත් කරන්නා හෙවත් රක්ෂණ ආවරණය ලබා ගන්නා පුද්ගලයා

## දෙවන පක්ෂය - (රක්ෂකයා)

රක්ෂණ යෝජනාව පිළිගන්නා පාර්ශ්වය හෙවත් රක්ෂණ සමාගම


- මෙයට අමතර ව තෙවන පක්ෂය නමින් පාර්ශ්වයක් ද සිටිය හැකි ය. තෙවන පක්ෂය යනු ගිවිසුමේ ක්‍රියාකාරිත්වය තුළින් ඇති වන බාහිර පක්ෂ පිළිබඳ සම්බන්ධතාවයි.

ClassWork.LK

# රක්ෂණ ගිවිසුමක් වලංගු වීම සඳහා පැවතිය යුතු මූලිකාංග

- නෛතික බැඳීමක් ඇති කර ගැනීමේ අදහස
- අර්පනය හෙවත් යෝජනාව
- ප්‍රතිග්‍රහණය හෙවත් පිළිගැනීම
- නෛතික බව - නීතියට එකග බව
- ඒ ඒ පාර්ශ්වයන්ට නෛතික බැඳීමක් ඇති කර ගැනීමට ඇති හැකියාව

ClassWork.LK


පළමු මස
නොමිලේ...
2022
ADVANCED
LEVEL
BUSINESS
STUDIES
MASS CLASS
ONLINE CLASS
ZOOM තාක්ෂණය ඔස්සේ...
මාර්තු
27
ලියාපදිංචි වීමට :-
076 36 55 550
ඉරිදා
උදෑසන 11.00
සුපුන් මදුශංක
B.sc.(Mgt) Accounting (Special) (U.G.)
University of Sri Jayewardenepura